සිරිත් මල්දම

සිරිත් මල්දම නැමැති අවවාද සංග්‍රහය 1895 වර්ෂයේ දී කිරිදිවැල කණිටු විද්‍යාලයේ ඇම්. ඇල්. සිල්වා ගුරුමුහන්දිරම් මැතිතුමා විසින් රචනා කරන ලදි.

1.මහත් සෙත් වඩවන
සිරිත් මල්දම බලමින
සිරිත් හොඳ දැනගෙන
මහත් යසසිරි ලබනු දෙලොවින

2.හොඳ ලෙස හැදීමට
හොඳ සිත ඕනෑ හැමවිට
නරක සිත් ඇති විට
නරකමයි සිද්ධ වන්නෙ අපහට

3.නරක සිතකින් නම්
හොඳක් නොකළැකි කිසියම්
හොඳක් නොකළේ නම්
උපන් ගතියෙන් නැත පලක් නම්

4.පව් නම් නරක මය
එයින් දෙලොවෙහි දුක මය
පින් නම් උතුම් මය
එයින් දෙලොවෙහි මහත් සැප මය

5.තමන් පන ලෙස හැම
සතුන් ගැන සළකා පෙම
ඔවුන් දුටු විලසම
කරන් ආදර ගුණය නොහැරම

6.සෙල්ලම් සිතින් වත්
යම් කිසි තරහකින් වත්
මරණ සිතකින් වත්
සතුන්හට වද දීම නොහොබිත්

7.නොමින් දුක විඳමින
අනුන් සෙව් දන මිළ දැන
හොරෙන් නො ගනුව පැන
සිතින් කැබිලිති ලෙසින් ඒ ගැන

8.අනුන් ගෙන් නැති උන
දෙයක් ලැබුණොත් යම් දින
එය සඟවා නොගෙන
දෙන්ට කරුණා කරන් සතුටින

9.කුණු සරුප නො කියනු
කේලම් වචන නො කියනු
විහිලු බොරු නො කියනු
ඇනුම්පද කිසිවෙකුට නො කියනු

10.බොරු කීම කැතමය
ගැරඬි කුණටත් නො සමය
ඇත්ත නම් කදිමය
මෙලොව රජ සැපතටත් උතුමය

11.අතින් අත බැඳ පෙළ
නොයන් මංමාවත් වල
තැනින් තැන කඩවල
නොයන් කරුණක් නැතිව කිසි කල

12.තැනින් තැන ගෙන් ගෙට
ගොසින් බලමින් වට පිට
අනුන් කන බොන විට
ලොබින් නොයිඳින් නැතත් කෑමට

13.දනන් නිති ගැවසෙන
තැනින් කුඩ ඉසලාගෙන
සැරෙන් බස් කියමින
ගමන් නොකරන් උඩඟු විලසින

14.පාරෙ යන එන විට
අයින් වීමෙන් දකුණට
දුව පැන දඟ නො කොට
ගමන් කළ යුතුය කී හැම විට

15.යම් කිසි ගෙදරකට
ගිය කල ඕනෑ කමකට
ඔවුන් නොම දැක ගෙට
ඇතුල් නොමවන් නොහොබි සිරිතට

16.සුදු කෙළි පලකට
කොලහල කෙරෙන තැනකට
තැබෑරුම් පලකට
යාම හොඳ නැත බලා ඉඳුමට

17.නාඩගම් බැලුමට
විහිළු කෝලම් බැලුමට
යක් තොවිල් බැලුමට
නො යන් නොහොබින එවැනි තැනකට

18.අව්වෙහි ගොසින් වත්
සෙල්ලම් කිරීමෙන් වත්
වෙහෙස වී සිටියොත්
නොබොනු ඇල්දිය තිබහ තිබුනත්

19.අඟුරු හුණු කැට ගෙන
විහිලු නො ලියනු තැන තැන
බිත්ති කණු කිසි තැන
යමක් නො ලියනු අයුතු විලසින

20.ගුරු බස සැබෑමය
එය පිළිගැනුම යුතුමය
පඬි බසත් එයමය
එයින් දෙලොවෙහි මහත් සැපමය

21.ගුරුවරු කිසිම විට
සතුටු නොම වෙති තැළුමට
හොඳින් එය සිහි කොට
වරෙදි නොකරන් තැළුම් කෑමට

22.තක්කඩි කම් කළොත්
දඬුවම් දෙති සැක නැත්
දඬුවම් නුදුන්නොත්
ළමයි කිසිකල හොඳින් නොහැදෙත්

23.වැරදි කළ අය හට
දඬුවම් දෙන්නෙ හැදූමට
හැදෙන අය එම විට
හොඳින් කීකරු වෙති නැමී සිට

24.ඉර උදා වෙන්නට
පළමුව නැගිට සිහිකොට
අලසකම් දුරුකොට
කරන් වැඩ පල දියුණු වන්නට

25.ගෙදොර අතුගෑමෙන
මුණ කට සෝදා ගෙන
ඔලුව පීරාගෙන
අකුරු පාඩම් කටනු සතුටින

26.අත පය සෝදා ගෙන
නරක කෑමක් නොම ගෙන
හොඳ දෙයක් කෑමෙන
සැරසෙන්න පාසැලට යන මෙන

27.කිලිටු රෙදි බැනියම්
ඇඳුම් නාදිනු කිසියම්
පිරිසිදු නිසි ඇඳුම්
අඳින් හැම කල නුඹට ඇත්නම්

28.දිග නිය පොතු වැඩුනු
තිබුව හොඳ නෑ කප්පනු
දත් පෙල කුණු බැඳුනු
පෙණෙයි කැත ලෙස හොඳින් සෝදනු

29.සෙම් සොටු පෙරා ගෙන
කුණු කෙළ වයිරිලා ගෙන
දැලි කුණු තවරැගෙන
ඉඳුම කැත ලෙස පෙණෙයි බැලූ තැන

30.හිස අවුල් කරගෙන
කිලුටු වැරහැලි ඇඳගෙන
පඹයෙකුගෙ විලසින
ඉඳුම හොඳ නෑ බූත කර මින

31.තම දෙවියන් නැමද
මව් පිය දෙදෙන දැක වැඳ
ගුරුන් වෙත ගොස් වැඳ
අකුරු නිසි ලෙස ඉගෙණ ගනු සොඳ

32.පාසැලට යන එන
අතර මගදී නිසි තැන
කොලාහල නොකරමින
ගමන් කරපන් සිල්වතෙකු මෙන

33.තම පොත් පත් රැගෙන
නියම තැන් වල ඉඳ ගෙන
ගෝසා නොකර මින
කරනු පාඩම් සිතට අරගෙන

34.පාසැලෙහි තැන තැන
නොයන් දුවමින් බලමින
දඟ නොකර ඉඳගෙන
ගුරුන් කී දෙය කරන් එලෙසින

35.අනුන්ගේ පොත් පත්
නාදිනු නොගනු කිසිවක්
උවමනා කළහොත්
කියා ඉල්ලා ගැනුම යහපත්

36.ගල්ලෑලි පොත් පත්
පෑන් පැන්සල් සැවොමත්
තම සැලකුම ඇතොත්
තමන් ගාවම තිබෙයි සැක නැත්

37.ගල්ලෑලි පොත්වල
විහිළු නොලියනු කිසිකල
පිරිසිදුව හැම කල
තබනු පොත් පත් සියලු දේපල

38.පාසැලෙහි තැන තැන
කෙල නො ගසන් නොහොබි දැන
සෙම් සොටු සුරමින
මිදුලෙහිද නො දමන් කිසි තැන

39.සිඟා කා ගෙන වත්
කිලුටු වැරහැලි ඇඳ වත්
බිම වැටී ඉඳ වත්
මහත් සැපවෙයි ඉගෙන ගත්තොත්

40.මවු පිය රවටලා
නොගනින් කිසිත් ඉල්ලා
මව් පියන් වැඳලා
ගනින් ඕනෑ යමක් ඉල්ලා